දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/6/AT/Labour Trib/2024
ඔබේ අංකය / உமது இல. / Your No.: MOJ/E21/ලු.ලේ/භාෂා.ප/ ලිපි/වා.ස්.මාරු/2024
දිනය / திகதி / Date: 2024.05.20

ලේකම්

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**<u>කම්කරු විනිශ්චය සභා ලඝු ලේඛක, ලිපිකරු හා භාෂණ පරිවර්තක තනතුරු 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයට අනුයුක්තව ලඝු ලේඛක, ලිපිකරු හා භාෂණ පරිවර්තක තනතුරුවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව වහාම එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටිය මගින් නියම කර ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03. එසේම මේ වන විට සියළුම රාජ්‍ය ආයතනවල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල දක්වා ඇති ස්ථානමාරු කාල සටහන් සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර ඔබ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ වාර්ෂික ස්ථානමාරු පටිපාටීන්හි ස්ථානමාරු කාලසටහන්ද යථෝක්ත තීරණයට අනුගත වන පරිදි සංශෝධනය කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

04. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

06. 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

07. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

08. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**පිටපත:** කම්කරු විනිශ්චය සභා ලේකම් - කැරු. දැ.ගැ.ස. හා අ.ක.ස.

**කම්කරු විනිශ්චය සහා ලඝු ලේඛක, ලිපිකරු හා භාෂණ පරිවර්තක තනතුරු වාර්ෂික ස්ථාන මාරු 2024 අභියාචනා**
**- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ**

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථානමාරු ලැබූ නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | එම්.කේ.එන්.ජී.ලක්මාලි මිය | ලඝු ලේඛක | අංක 08 - කම්කරු විනිශ්චයාධිකාරය | අංක 26 කම්කරු විනිශ්චයාධිකාරය - මාතර | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු චක්‍රය අවලංගු කිරීම හා 2025 වාර්ෂික ස්ථාන මාරු වලදී නිලධාරිනියගේ කැමැත්ත අනුව ස්ථාන මාරුව සිදු කිරීමට ප්‍රමුඛතාවය ලබා දීමට ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත දැන්වීම |
| 2 | එච්.කේ.එන්.පී.සෙනරත් මිය | ලඝු ලේඛක | අංක 26 - මාතර කම්කරු විනිශ්චයාධිකාරය | අංක 25 - පානදුර කම්කරු විනිශ්චයාධිකාරය | අභියාචනයට ඉඩ ලබා දෙමින් ස්ථාන මාරු චක්‍රය අවලංගු කිරීම හා විශේෂ අවශ්‍යතාවයක් ලෙස සළකා ඉදිරියේදී ස්ථාන මාරු ලබා දීමේදී දකුණු පළාත තුලම ස්ථාන මාරු ලබා දීමට ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත දැන්වීම |
| 3 | ටී.ජී.ලස්නි මනෝරා මිය | ලඝු ලේඛක | අංක 13 කම්කරු විනිශ්චයාධිකාරය අංක 13 | අංක 01/02 අතිරේක බත්තරමුල්ල කම්කරු විනිශ්චයාධිකාරය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 4 | ඩී.ඩබ්.එස්.ජයමාලි මිය | ලඝු ලේඛක | අංක 18 කළුතර කම්කරු විනිශ්චයාධිකාරය | අංක 01 කොළඹ කම්කරු විනිශ්චයාධිකාරය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 5 | එම්.සී.පීරිස්පුල්ලේ මෙය | භාෂණ පරිවර්තක | ගම්පහ කම්කරු විනිශ්චයාධිකාරය | – | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම හා 2023.09.05 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය පරිදි කටයුතු කරන ලෙස ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත දැන්වීම |
| 6 | එම්.අයි.එම්.සාහිර් මයා | භාෂණ පරිවර්තක | අංක 26 මාතර කම්කරු විනිශ්චයාධිකාරය | අංක 04 ගාල්ල කම්කරු විනිශ්චයාධිකාරය | අභියාචනයට ඉඩ ලබා දෙමින් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 7 | කේ.ජී.එන්.සුදර්ශනී මිය | ලිපිකරු | බලන්ගොඩ කම්කරු විනිශ්චයාධිකාරය | ස්ථානමාරු ලබා දී නැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම හා 2025 වාර්ෂික ස්ථාන මාරු වලදී නිලධාරිනියගේ කැමැත්ත අනුව ස්ථාන මාරු ලබා දීමට ප්‍රමුඛතාව ලබා දෙන ලෙස ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත දැන්වීම |